සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

25B | S | I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 12 - 2018**

විභාග අංකය .............................

# යුරෝපා ඉතිහාසය I

කාලය පැය තුනයි

උපදෙස්

- ♦ මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- ♦ එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- ♦ I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

◈ **අංක 01 සිට 10 තෙක් ඇති ප්‍රශ්න සඳහා දී ඇති නම් පහෙන් එකක් අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නමෙහි අංකය වරහන තුළ ලියන්න.**

01. 1. ප්‍රංශය 2. යුගෝස්ලාවියාව 3. ස්පාඤ්ඤය
4. බෙල්ජියම 5. පෘතුගාලය (.....)

02. 1. කතිපයාධිපති ආණ්ඩුව 2. රාජාණ්ඩුව 3. ප්‍රභූ තන්ත්‍රය
4. අධිරාජ්‍යය 5. ප්‍රජාතන්ත්‍රවාදය (.....)

03. 1. ඊස්කිලස් 2. සොෆොක්ලීස් 3. යුරිපිඩීස්
4. ප්ලේටෝ 5. ඇරිස්ටොෆොනීස් (.....)

04. 1. පුද්ගලික හමුදා සිටීම 2. ප්‍රවේණි ඉඩම් භුක්තිය 3. ශෂ්‍යමාරු ක්‍රමය
4. කට්ටි මාරු ක්‍රමය 5. ස්වයංපෝෂිත බව (.....)

05. 1. උතුරු මුහුද 2. මධ්‍යධරණී මුහුද 3. කළු මුහුද
4. අත්ලාන්තික් සාගරය 5. පැසිපික් සාගරය (.....)

06. 1. ජෝන් වෙක්ලිෆ් 2. ජෝන්හස් 3. ජෝන්ටේට්සල්
4. උල්රිච් ස්විංග්ලි 5. ජෝන් කැල්වින් (.....)

07. 1. නිකලස් කොපර්නිකස් 2. ප්‍රෙස්ටර් ජෝන් 3. ජොහැන්ස් කෙප්ලර්
4. මයිකල් සර්වෙස් 5. ගැලීලියෝ ගැලිලි (.....)

08. 1. ඩෙන්මාර්ක් 2. ප්‍රංශ 3. ස්වීඩන්
4. බොහීමියා 5. ජර්මන් (.....)

09. 1. පිරනීස් 2. ඇල්ප්ස් 3. ඊරියල්
4. යුරල් 5. කොකේසස් (.....)

10. 1. ඇමරිගෝ වෙස්පුචි 2. කෝටේස් 3. පිසාරෝ
4. බැල්බෝවා 5. අයිසැක් නිව්ටන් (.....)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න වල දී ඇති පද යුගල වලින් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැලපෙන යුගලයෙහි අංකය වරහන තුළ ලියන්න.**

11. 1. ඇරිස්ටෝටල් - ලයිසියම්
2. ස්පුරික් කාවිලියම් - මුදල් අයකරන පාසල
3. ප්ලේටෝ - ඇකඩමිය
4. රෂේස් - වෛද්‍ය විද්‍යාවේ පරිචය
5. ලූතර් - කතෝලික වාදය (.....)

12. 1. ෆාර්ඩිනන්ඩ් ඉසබෙලා - ස්පාඤ්ඤයේ එක්සත්කම
2. රිචලියූ - නැන්ට්ස් ආඥාව පැනවීම
3. හතරවන හෙන්රි - ප්‍රංශයේ ආගමික සමෘද්ධිය
4. හත්වන හෙන්රි - ප්‍රබල රාජාණ්ඩුවක් බිහිකිරීම.
5. අටවන හෙන්රි - එංගලන්තය පාප්වහන්සේගේ ආධිපත්‍යයෙන් මිදීම. (.....)

13. 1. වැඩවසම් ක්‍රමය - වෙළඳාමේ දියුණුව
2. නව රාජාණ්ඩු ක්‍රමය - බලය සංකේන්ද්‍රගත වීම.
3. ධනවාදය - බද්ධ ව්‍යාපාර සමාගම්
4. රෙපරමාදු ව්‍යාපාරය - කතෝලික සභාව බෙදීයාම
5. තිස් අවුරුදු යුද්ධය - ප්‍රංශයේ බලය වර්ධනය වීම. (.....)

14. 1. පිරනීස් - කඳුවැටිය
2. රයින් - ගංගාව
3. ඩාඩනල්ස් - සමුද්‍ර සන්ධිය
4. සූවස් - මුහුද
5. ශාන්ත හෙලේනා - දූපත (.....)

15. 1. හෙරඩෝටස් - ඉතිහාසයේ පියා
2. සොක්‍රටීස් - මුල්වරට ගණිත ක්‍රම සොයා ගැනීම.
3. ඇරිස්ටෝටල් - නූතන දේශපාලන විද්‍යාවේ පියා
4. හිපොක්‍රටීස් - බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා
5. ආකිමිඩිස් - ජලෝත්පීඩන න්‍යාය (.....)

- **අංක 16 - 25 තෙක් වූ ප්‍රශ්නය සඳහා x හා y තීරුවල නාම/ප්‍රකාශන/දින වකවානු දී ඇත. x හා y තීරු ගැළපෙන අනුපිළිවෙළට සකස්කළ විට පහත දී ඇති සංකේත පහෙන් එකක් නිවැරදිය. එම නිවරදි අංකය තෝරා වරහන තුළ යොදන්න.**

16.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ඇපලෝ | A | සියලු දෙවියන්ගේ අධිපති |
| 2. | ඇතීනා | B | සියුස් දෙවියන්ගේ බිරිඳ |
| 3. | හෙරානා | C | සියුස් දෙවියන්ගේ දියණිය |
| 4. | හර්කියුලීස් | D | ලෝකය ඔසවාගෙන සිටින්නා |
| 5. | සියුස් | E | සූර්ය දෙවියා |

1. ECBDA 2. DECAB 3. ECDBA 4. EDABC 5. CEBDA (.....)

17.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ජොහැන්ස් කෙප්ලර් | A | ගුරුත්වාකර්ෂණය |
| 2. | අයිසෙක් නිව්ටන් | B | රුධිර සංසරණ පද්ධතිය |
| 3. | පැරසල්සස් | C | සූර්ය කේන්ද්‍රවාදය |
| 4. | විලියම් හාවි | D | ඉලිප්සියාකාර ගමන්මග |
| 5. | නිකලස් කොපර්නිකස් | E | ලෙඩ රෝග වැළඳෙන ක්‍රම |

1. DEACB 2. CDAEB 3. DAEBC 4. DEABC 5. AEDCB (.....)

18.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ස්පාඤ්ඤය | A | නිශ්ශබ්ද විලියම් |
| 2. | එංගලන්තය | B | vi වන චාල්ස් |
| 3. | ප්‍රංශය | C | vii වන හෙන්රි |
| 4. | නෙදර්ලන්තය | D | ෆාර්ඩිනන්ඩ් හා ඉසබෙලා |
| 5. | ඔස්ට්‍රියාව | E | vi වන හෙන්රි |

1. ECEAB 2. DECBA 3. DABCE 4. DBAEC 5. DEBAC (.....)

19.

| | X | | Y |
|---|---|---|---|
| 1. | වස්කෝද ගාමා | A | ලන්දේසි |
| 2. | වස්කෝද බැල්බෝවා | B | ස්පාඤ්ඤ |
| 3. | ප්‍රැන්සිස් ඩ්‍රේක් | C | පෘතුගීසි |
| 4. | ජැක්වීස් කාටියර් | D | ඉංග්‍රීසි |
| 5. | හෙන්රි හඩ්සන් | E | ප්‍රංශ |

1. DEBAC 2. CBEDA 3. BCEDA 4. CBDEA 5. BDCEA (.....)

20.

| | X | | Y |
|---|---|---|---|
| 1. | වෙක්ලිෆ් | A | රෝස යුද්ධ |
| 2. | vii වන හෙන්රි | B | දෘෂ්ටි විද්‍යාව |
| 3. | ටෙට්සල් | C | ලොලාර්ඩ් ව්‍යාපාරය |
| 4. | ඉග්නේෂස් ලොයෙලා | D | පව් සමාකිරීමේ පත්‍රිකා |
| 5. | අල්හසන් | E | ජේසුයිට් නිකාය |

1. DABCE 2. CADEB 3. CEADB 4. CDAEB 5. EDABC (.....)

21.

| | X | | Y |
|---|---|---|---|
| 1. | සැවෝයි | A | හෝල්ස්ටයින් |
| 2. | ඇල්සාස් | B | ලොරේන් |
| 3. | සාර්ඩිනියා | C | නීස් |
| 4. | ඔස්ට්‍රියා | D | පිඩ්මොන්ට් |
| 5. | ෂෙල්ස්විග් | E | හංගේරියාව |

1. CABDE 2. CBDEA 3. CDEAB 4. CEABD 5. CADEB (.....)

22.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ඩොනටෙලෝ | A | වීනස්ගේ උපත |
| 2. | මයිකල් ආන්ජිලෝ | B | මොනාලිසා |
| 3. | ටිටියන් | C | මෝසස් |
| 4. | ලියනාඩෝ ඩාවින්චි | D | v වන චාල්ස් |
| 5. | බොට්ටිසෙල්ලි | E | ඩේවිඩ් |

1. CEDAB 2. EDCBA 3. ABCDE 4. CDABE 5. ECDBA (.....)

23. X | Y

| | X | | Y |
|---|---|---|---|
| 1. | කොලොම්බස් | A | ක්වීබෙක් |
| 2. | කබ්රාල් | B | බ්‍රසීලය |
| 3. | බර්තොලමියු දියෙස් | C | ශුභ පැතීමේ තුඩුව |
| 4. | ජෝන් කැබෝ | D | කේප් බ්‍රිටන් |
| 5. | මාක්විටේ | E | බහමා දිවයින |

1. EBCDA 2.CABDE 3. CDABE 4.BDEAC 5.DEAB (.....)

24.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ජෝන් කැල්වින් | A | ලන්දේසි |
| 2. | ඉරාස්මස් | B | ස්විස් |
| 3. | ජෝන් වයික්ලිෆ් | C | ප්‍රංශ |
| 4. | උල්රිච් ස්විංග්ලි | D | බොහීමියන් |
| 5. | ජෝන් හස් | E | ඉංග්‍රීසි |

1. CBEAD 2. ABCDE 3. CAEBD 4 CDABE 5. BDEAC (.....)

25.

| | X | | Y |
|---|---|---|---|
| 1. | එංගලන්තය | A | බූර්බන් |
| 2. | ප්‍රංශය | B | ඔරෙන්ජ් |
| 3. | ඕලන්දය | C | හැප්ස්බර්ග් |
| 4. | ප්‍රෂියාව | D | හොහෙන්සොලන් |
| 5. | ඔස්ට්‍රියාව | E | ස්ටුවට් |

1. AEBDC 2. BDCAB 3. CBEAD 4. EABDC 5. BDACE (.....)

◈ **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති ප්‍රතිචාර අතරින් එකක් හෝ කිහිපයක් නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,**

Aහා B පමණක් නිවැරදි නම් අංක 1 ද B හා C පමණක් නිවැරදි නම් අංක 2 ද

C හා D පමණක් නිවැරදි නම් අංක 3 ද A හා C පමණක් නිවැරදි නම් අංක 4 ද

ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි ගණනක් නිවැරදි නම් අංක 5 ද අදාළ හිස්තැනෙහි ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | Aහා C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

26. පහත දක්වෙන නම් අතරින් ඇතන්ස් නගරයේ පාලකයන් කවුරුන්ද?

A) ක්ලිස්තීනිස් B) පෙරික්ලීස් C) ඩේරියස් D) ජූලියස් සීසර් (.....)

27. පහත දැක්වෙන සාධක අතුරෙන් තිස් අවුරුදු යුද්ධයට තුඩුදුන් හේතු කවරේද?

A) ශුද්ධ රෝම අධිරාජ්‍යයා හා පාප් වහන්සේ අතර ගැටුම

B) ඔග්ස්බර්ග් සාම ගිවිසුමේ අඩුපාඩු

C) ජර්මන් කුමාරවරු අතර පැවති ආගමික මතභේද

D) ජේසු සංගමය පිහිටුවීම (.....)

28. පහත සඳහන් සාධක අතරින් වැඩවසම් ක්‍රමයෙන් පරිහාණියට තුඩුදුන් ඒවා කවරේද?

A) වෙළඳම හා වානිජ්‍යය වර්ධනය වීම. B) මුදල් භාවිතය පැතිරයාම.

C) මධ්‍යම පංතියේ නැගීම D) ස්වයංපෝෂිත ආර්ථිකය (.....)

29. පහත දැක්වෙන සාධක අතරින් පසු කාලීන මධ්‍යතන යුගයේ ජීවත් වූ ඉතාලි ලේඛකයෝ කවරහුද?

A) ඩාන්ටේ B) පෙට්රාක් C) බොකැෂියෝ D) බොටිටිචෙලි (.....)

30. පහත දැක්වෙන සාධක අතරින් මුල්කාලීන දේශගවේෂණ වලට තුඩුදුන් ඒවා කවරේද?

A) ආසියාව සමඟ වෙළදාමේ යෙදීමට ස්පාඤ්ඤයන් හා පෘතුගීසින් තුළ වූ දැඩි අභිලාශය

B) කොන්ස්තන්තිනෝපලය තුර්කීන් යටත් කර ගැනීම.

C) ජර්මනියේ කතෝලික ප්‍රතිසංස්කරණ

D) එංගලන්තයේ කාර්මික විප්ලවය (.....)

- **අංක 31 - 35 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් එක් මාතෘකාව යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ එම නොගැළපෙන කරුණ තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

31. ජාතික රාජ්‍ය

1. බලය රජු වෙත සංකේන්ද්‍රණය කරන ශක්තිමත් රාජාණ්ඩුව
2. බලවත් වැඩවසම් රදළ පංතිය
3. ශක්තිමත් ස්ථාවර හමුදාව
4. වෙළඳමේ ව්‍යාප්තියට රාජ්‍ය අනුග්‍රහය ලැබීම.
5. රජවරු විසින් මධ්‍යම පංතියේ ආධාර ලබා ගැනීම. (.....)

32. ආගමික ප්‍රතිසංස්කරණ

1. ආගමික ප්‍රි.සංස්කරණ ජර්මනියෙන් ඇරඹීම.
2. එහි නායකයා මාටිං ලූතර් වීම.
3. ආසන්නතමහේතුව පුණ්‍යඵල පත්‍රිකා විකිණීමයි.
4. ස්විට්සර්ලන්තයේ ප්‍රතිසංස්කරණ නායකයා කැල්වින් වීම.
5. පාප් වහන්සේ ඊට අනුග්‍රහ දැක්වීම. (.....)

33. ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය

1. ජේසුයිට් නිකාය
2. ට්‍රෙන්ට් සම්මේලනය
3. ධර්මාධිකරණය
4. නිශ්ශබ්ද විලියම් ඝාතනය
5. මිෂනාරී ව්‍යාපාරය ආරම්භ වීම. (.....)

34. ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය,

1. නූතන යුරෝපා ශිෂ්ටාචාරය බිහිවීමේ එක් පදනමකි.
2. කොන්ස්ටන්ටයින් අධිරාජයාගේ මිලාන් ආඥාව
3. යුරෝපා සමාජයට ලැබුණු සංවිධානාත්මක ආගමය.
4. සමාරා පල්ලිය වැදගත් වේ.
5. ශුද්ධ රෝම අධිරාජ්‍ය තනතුර බිහිවිය. (.....)

35. රෝම ශිෂ්ටාචාරය
1. ප්ලේටෝගේ මරණයෙන් පසු රෝම අධිරාජ්‍යයේ පරිහානිය ආරම්භ විය.
2. ජස්ටීනියන් අධිරාජ්‍යයේ නීති ක්‍රමය වැදගත් විය.
3. ප්‍රධාන ආදායම් මාර්ගය වූයේ විදේශ වෙළඳාමයි.
4. සොෆිගිනස්ගේ දින දර්ශනය වැදගත්ය
5. ප්ලේටෝගේ පරමාදර්ශී රාජ්‍ය නම් කෘතිය වැදගත්ය. (.....)

❖ **අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාලව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1,2,3,4,5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරන්න.**

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදිය | වැරදිය |
| 2. | නිවැරදිය | නිවැරදිය |
| 3. | වැරදිය | වැරදිය |
| 4. | වැරදිය | නිවැරදිය |
| 5. | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදාදෙයි. |

| පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 36. රෝම සමූහාණ්ඩුවාදී යුගයේ ඉහළ ප්‍රභූ පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනය දෙමාපියන් විසින්ම පවත්වාගෙන යන ලදී. | මේ යුගයේ ඔවුන්ගේ අධ්‍යාපනය හරහා දැනුම දීමට වඩා චිරාගත රෝම ගති සිරිත් හා වීර චරිත පිළිබඳ ආදර්ශ බාල පරපුරට ලබාදීම සිදුවිය. (.....) |
| 37. දේශපාලන වැඩවසම් ක්‍රමය ප්‍රධාන වශයෙන් දේශපාලන බල විකේන්ද්‍රණය වූ ක්‍රමයකි. | IV වන හෙන්රි විසින් එංගලන්තයේ රෙපරමාදු ව්‍යාපාරය ඇරඹීය. (.....) |
| 38. උල්රිච් ස්විංග්ලි ජර්මනියේ ආගමික ප්‍රතිසංස්කරණයට නායකත්වය දැරීය. | කොලොම්බස් ලොව වටා යාත්‍රාකොට පෘතුවිය ගෝලාකාර බව සනාථ කළේය. (.....) |
| 39. පැරසල්සස් රුධිර සංසරණය සොයා ගත්තේය. | උත්කෘෂ්ට විප්ලව සමයේදී එංගලන්තයේ පාලක I චාල්ස් රජතුමාගේ හිස ගසා මර දැමීය. (.....) |
| 40. ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය නමින් හඳුන්වන්නේ ප්‍රොතෙස්තන්තවාදයට කතෝලික සභාවෙන් එල්ල වූ ප්‍රතික්‍රියාවයි. | ඉන් අපේක්ෂා කළේ ප්‍රොතෙස්තන්ත්‍රවාදයෙන් ඉදිරිපත්වූ මිථ්‍යා දෘෂ්ටික අදහස් බිඳ දැමීම හා එහි ව්‍යාප්තිය වළක්වා ආගමික එක්සත් බව යළි ඇතිකිරීමයි. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

25B S II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 12 - 2018**

විභාග අංකය .............................

# යුරෝපා ඉතිහාසය II

**උපදෙස්**

♦ පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

01. ඔබට සපයා ඇති සිතියමෙහි පහත සඳහන් සියළුම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් ඔබ කැමති ස්ථාන දෙකක් පිළිබඳව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

1. එංගලන්තය  2. කීල් ඇල  3. ඩාඩනල්ස් සමුද්‍ර සන්ධිය
4. කෝර්සිකා  5. රයින් ගඟ  6. කොන්ස්තන්තිනෝපලය
7. කළු මුහුද  8. ඉතාලිය

(සිතියම් ලකුණු කිරීමට 8 ඓතිහාසික සටහනකට 5 බැගින්)  (8 + 5 x2 =18)

02. (i) පහත දැක්වෙන ක්ෂේත්‍රවල පුරාණ ග්‍රීකයන්ගේ කාර්ය සාඵල්‍ය පරික්ෂා කරන්න.

1. ආගම  2. සාහිත්‍යය  3. දර්ශනය  (ල. 7)

(ii) පුරාණ රෝමවරුන්ගේ ආණ්ඩුක්‍රමය පිළිබඳව සැකෙවින් පරීක්‍ෂා කරන්න.  (ල. 7)

03. පහත සඳහන් කරුණු ඇසුරෙන් මධ්‍යකාලීන යුරෝපයේ වැඩවසම් ක්‍රමය පිළිබඳ විග්‍රහයක් කරන්න.

(i) ප්‍රවේණිය  (ii) බල විකේන්ද්‍රණය  (iii) සාමූහිකත්වය  (ල. 14)

04. ''මධ්‍යකාලීන යුරෝපය නූතන යුරෝපය බවට පත්කළ ප්‍රවාහ සාධකය වූයේ පුනරුදයයි.'' ඊට අදාළ පහත සඳහන් ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(i) 1453 දී කොන්ස්තන්තිනෝපලය ඔටෝමන් තුර්කීවරයන් අතට පත්වීම පුනරුදය කෙරෙහි බලපෑ ආකාරය පරික්ෂා කරන්න.  (ල. 4)

(ii) පුනරුද අවධියේ යුරෝපයේ ඇති වූ දේශපාලනය සහ ආර්ථික වර්ධනය පැහැදිලි කරන්න.  (ල.10)

05. ''ආගමික ප්‍රතිසංස්කරණ අරමුණුකොටගෙන ඇරඹුනු රෙපරමාදු ව්‍යාපාරය අවසන් වූයේ ආගමික විප්ලවයකිනි.''

(i) ප්‍රොතෙස්තන්ත රෙපරමාදුව ආරම්භ කළ නායකයා නම් කරන්න.  (ල. 1)

(ii) ප්‍රොතෙස්තන්ත රෙපරමාදුව ආරම්භ වූ රට නම් කරන්න.  (ල. 1)

(iii) ප්‍රොතෙස්තන්ත රෙපරමාදුව ඇතිකිරීම බලපෑ සාධක සැකෙවින් දක්වන්න.  (ල. 5)

(iv) ප්‍රොතෙස්තන්ත රෙපරමාදුවෙන් උද්ගත වූ ප්‍රතිඵල කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත සඳහන් ප්‍රකාශය පරීක්‍ෂා කරන්න.  (ල. 7)

06. (i) නව රාජාණ්ඩු ක්‍රමයේ ප්‍රධාන අංග ලක්ෂණ මොනවාද? (ල. 6)

(ii) පහත සඳහන් පුද්ගලයින්ගෙන් එක් අයෙකු තෝරාගෙන නව රාජාණ්ඩුවක් ගොඩනැගීමේදී ඔහුගේ ඉටු වූ සේවය පරීක්ෂා කරන්න.

අ. ප්‍රංශයේ iv හෙන්රි

ආ. ප්‍රංශයේ කාඩිනල් රිඩලියු

ඇ. එංගලන්තයේ vii හෙන්රි (ල. 8)

07. ' දේශගවේෂණ කටයුතු මධ්‍යකාලීන යුරෝපය නූතන යුරෝපය බවට පරිවර්තනය කළ ප්‍රධාන සාධකයකි.

(i) මුල්කාලීන දේශගවේෂණ වලට අනුග්‍රහ දැක්වූ පාලකයින් දෙදෙනෙකු නම් කරන්න. (ල.2)

(ii) යුරෝපයේ රටවල් විසින් සිදු කරන ලද මුල්කාලීන ගවේෂණ සැකෙවින් දක්වන්න. (ල.4)

(iii) දේශගවේෂණ වලින් උද්ගත වූ ප්‍රතිඵල ඇසුරෙන් ඉහත සඳහන් ප්‍රකාශනය සාකච්ඡා කරන්න. (ල.8)

08. 'තිස් අවුරුදු යුද්ධය යුරෝපයේ සංධිස්ථානයක් සලකුණු කරයි'' පහත සඳහන් අංශ කෙරෙහි අවධානය යොමු කරමින් මේ කියමන පරීක්ෂා කරන්න.

(i) තිස් අවුරුදු යුද්ධයට බලපෑ ආගමික හා දේශපාලන හේතු

(ii) වෙස්ට්පේලියා සාම ගිවිසුම

(iii) තිස් අවුරුදු යුද්ධයේ ප්‍රතිඵල (ල.14)

07. පහත සඳහන් මාතෘකාවලින් 02 ක් පිළිබඳව ඓතිහාසික සටහන් ලියන්න.

(i) ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

(ii) අරාබි ශිෂ්ටාචාරය


(iii) රෝම අධිරාජ්‍ය තුළ ක්‍රිස්තියානිය ව්‍යාප්ත වීම.

(iv) ස්පාඤ්ඤය ජාතික රාජ්‍යයක් වීම.

(ල.14)

**12 / 13 යුරෝපා ඉතිහාසය** - 12 / 13 ஐரோப்பிய வரலாறு

| | |
|---|---|
| විභාග අංකය<br>சுட்டெண் | |



# දෙවන වාර පරීක්ෂණය 2018 යුරෝපා ඉතිහාසය.

## පිළිතුරු

## 12 ශ්‍රේණිය 1 කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 2 | 11. | 5 | 21. | 2 | 31. | 2 |
| 2. | 4 | 12. | 2 | 22. | 5 | 32. | 5 |
| 3. | 4 | 13. | 1 | 23. | 1 | 33. | 4 |
| 4. | 1 | 14. | 4 | 24. | 3 | 34. | 4 |
| 5. | 5 | 15. | 2 | 25. | 4 | 35. | 5 |
| 6. | 3 | 16. | 1 | 26. | 1 | 36. | 2 |
| 7. | 2 | 17. | 3 | 27. | 2 | 37. | 1 |
| 8. | 5 | 18. | 1 | 28. | 5 | 38. | 3 |
| 9. | 3 | 19. | 4 | 29. | 5 | 39. | 4 |
| 10. | 5 | 20. | 2 | 30. | 1 | 40. | 5 |

### II කොටස පිළිතුරු

01. නිවැරදි සිතියම් ලකුණු කිරීමට ලකුණු 08
ඓතිහාසික සටහන් ලකුණු 10
18

02. (i) ආගම : ස්වභාවික වස්තූන්ට දේවත්වය ආරෝපනය, දෙවියන්ට මනුෂ්‍ය ස්වරූපය හා ගති සිරිත් ආරූඪ කිරීම, බහු දේව වාදයක් පැවතීම, ග්‍රීක ආගම නිදහස් චින්තනයට බාධා නොවීය, ආගමික එක්සත්භාවයක් පැවතීම, විවිධ කලාවන්ගේ දියුණුවට ආගමෙන් අනුබල ලැබීම.
සාහිත්‍යය : සාහිත්‍ය අංග කිහිපයකින් යුක්ත වීම.
වීරකාව්‍ය : ගෝමර්ගේ ඉලියම් හා ඔඩෙසි.
ගී කාව්‍ය : පින්ඩාර්ගේ හා සැනෝගේ නිර්මාණ
නාට්‍ය : ශෝකාන්ත / සුඛාන්ත ඉතිහාස කෘති
දර්ශණය : මුල්ම දාර්ශනිකයෝ, සොෆිස්ථිවරුන් හෙවත් විකණ්ඩවාදීන්, සොක්‍රටීස්, ප්ලේටෝ සහ ඇරිස්ටෝටල්. (ල. 7)
(ii) ආණ්ඩුක්‍රම 3ක් ක්‍රියාත්මක වූ බව * රාජාණ්ඩු * සමූහාණ්ඩු, * අධිරාජ්‍ය
මේ උදාහරණ සහිතව විස්තර කළ යුතුය. (ල. 7)

03. ප්‍රවේණිය : * වැඩවසම් ආර්තික රටාවක් පැවතිනි.* ප්‍රවේණිය යන්න විස්තර කළ යුතුය.
* පල්ලියටද ඉඩම් හිමිවිය. * ප්‍රවේණියේ ඉහළම ස්ථානයේ රදලයාගේ මාළිගය පිහිටා ඇත.
* සාමාන්‍ය වැසියා රජු/රදල/පූජක යන කාටස්වලට බදු ගෙවිය යුතුය.
* ප්‍රවේණිය ස්වයංපෝෂිතය. * ප්‍රවේණි දාසයන්ගේ දුක්ඛිත ජීවිතය
බල විකේන්ද්‍රණය : * වැඩවසම් ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ වූයේ බල විකේන්ද්‍රණයයි.
* රදලයින් යුධ සෙන්පතියන් හා ප්‍රාදේශීය පාලකයන් වශයෙන් කටයුතු කළනිසා රාජාණ්ඩුව බලවත් නොවීය.
* රජුට හමුදාවක් නොවීය. * රටවසියාද ආරක්ෂාව පතා රදළයන්ගේ පිහිට සෙවූහ.
* මේ නිසා රදළයන් රජුට වඩා බලවත් විය.
* රදලයන් අතර බලව්‍යාප්තිය සඳහා ගැටුම් ඇතිවිය.
* දේශපාලන අස්ථාවර බව.
සාමූහිකත්වය : * එදිනෙදා කටයුතු හා කෘෂිකාර්මික කටයුතු සාමූහිකව සිදුවිය.
* විවිධ රැකියාවන් සඳහා ශිල්ප ශ්‍රේණි විය. * පුද්ගලයා නොව ශ්‍රේණිය වැදගත් විය.

04. (i) * කොන්ස්තන්තිනෝපලය මුස්ලිම්වරුන්ට අයත්වීම නිසා ගොඩබිම් වෙළෙඳ මාර්ග වැසුණි. (ල. 14)
* එහි සිටි පැරණි ග්‍රීක රෝම දාර්ශණිකයින් තම පොත්පත් විනාශ වේයැයි සිතා ඒවා රැගෙන යුරෝපයට පලා ගියේය. (ල. 4)
(ii) දේශපාලනය වර්ධනය :
* නව රාජාණ්ඩු ක්‍රම. උදා : ස්පාඤ්ඤය, එංගලන්තය. ප්‍රංශය
* රජුගේ බල සංකේන්ද්‍රණය වීම. * ප්‍රාදේශීය පාලනය මධ්‍යම පන්තියට ලැබුණි. * රජුට ස්ථිර හමුදාවක් විය.

ආර්ථික ：

* වෙළඳාම දියුණු වීම. * මුදල් භාවිතය දියුණු වීම. * ප්‍රවේණි ක්‍රමය බිඳ වැටීම./ඉඩම් අයිතිය පුළුල් වීම. * නගර දියුණු වීම/බැංකු ක්‍රම / විනිමය ක්‍රම / බද්ධ ව්‍යාපාර සමාගම් ඇතිවීම. * ධනවාදය ආරම්භ වීම / යටත් විජිත අධිරාජ්‍යයක් ගොඩනැගීම. (ල. 10)

05. (i) මාටින් ලූතර් (ල. 1) (ii) ජර්මනිය (ල. 1)

(iii) ප්‍රොතෙස්තන්ත්‍ර රෙපරමාදුව ඇතිවීමට තුඩුදුන් ආගමික, දේශපාලන හා ආර්ථික හේතු කෙටියෙන් දක්විය යුතුය. (ල. 5)

(iv) * ක්‍රිස්තු සභාවේ එක්සත් බව බිඳ වැටීම. * විවිධ නිකායන් බිහිවීම. උදා ： තිස් අවුරුදු යුද්ධය

* ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරයේ ආරම්භය. * ජේසුයිට් නිකාය, ධර්මාධිකරණය, ට්‍රෙන්ට් සම්මේලනය මගින් කතෝලික ආගම ශක්තිමත් කිරීම. * යුරෝපයේ ආගමික අතින් විප්ලවකාරී වෙනසක් සිදුවිය.

(ල. 7)

06. (i) * නිශ්චිත දේශසීමාවක්/නිශ්චිත ජනගහණයක් පැවතීම. * ජාතිකත්වය/එකමුතුකම/සෛවරීබව.

* මධ්‍යගත පාලනය * රදල බලය දුර්වල වීම. * මධ්‍යම පංතියේ වර්ධනය.

* රජු සතු යුධ හමුදාව / ඒකීය නීති පද්ධතිය. * රජය ආර්ථික කටයුතු ලෙස මැදිහත් වීම. (ල. 6)

(ii) **<u>VI හෙන්රි</u> ：** * තවාරි හෙන්රි ලෙස ද හඳුන්වයි. * ප්‍රංශයේ පැවති ආගමික යුද්ධ සමථයකට පත්කිරීම.

* නැන්ටීස් ආඥාව නිකුත් කිරීම. * රදල බලය අඩු කිරීම.

* රජුගේ උපදේශකයන් ලෙස ඉන්ටෙන්ඩාන්ට්වරු පත් කිරීම.

* රජුට ස්ථිර යුධ හමුදාවක් සැකසීම. * ඒකීය නීති පද්ධතිය.

* රට කෘෂිකාර්මික හා කාර්මික අතින් දියුණු කිරීම.

* රජය ආර්ථික කටයුතුවලට මැදිහත්වීම. * යටත් විජිත් පිහිටුවා ගැනීම.

**<u>ප්‍රංශයේ කාඩිනල් රිචලියු ：</u>**

* ප්‍රංශයේ රජු සිටියදීම රජු වෙනුවෙන් කටයුතු කර ඇත. * VI වන හෙන්රි රජුගේ වැඩ කටයුතු ඉදිරියට ගෙන ගොස් ඇත. * රදල බලය මර්ධනය කිරීම. * ඉන්ටෙන්ඩාක්ට් නම් මධ්‍යම පන්තියේ සහය ලබාගත්හ.

* රදළයන්ගේ පුද්ගලික බලකොටු තහනම් කිරීම. * හියුගෝනෝවරුන්ගේ බලය අඩු කිරීම. * විදේශ වෙළඳමට අනුග්‍රහය දැක්වීම. * අධ්‍යාපන කටයුතු දියුණු කිරීම.

එංගලන්තයේ VII වන හෙන්රි ：

* එංගලන්තයේ පැවති රෝස යුද්ධය සමථයකට පත්කරන ලදී.

* යෝර්ක් හා ලැන්කැස්ටර් වංශ දෙක එකමුතු කළේය. * ටියුඩර් රාජවංශික නාමය ආරම්භ කළේය.

* අභ්‍යන්තර කැරලි මර්ධනය කළහ. * රදල බලය අඩුකිරීම.

* ස්ටාර් චේම්බර් නම්වූ විනිශ්චය මණ්ඩලය ඇති කිරීම. * රජුට යුධ හමුදාවක් සැකසීම. * දේශපාලන වලට උදව් දීම. (ල. 8)

07. (i) නාවික හෙන්රි, නෙර්ඩිකන්සි, ඉසබෙලා, VII හෙන්රි, VII හෙන්රි, I එලිසබෙත් (ල. 2)

(ii) පෘතුගාලය, ස්පාඤ්ඤය, එංගලන්තය, ප්‍රංශය හා ඕලන්දය සොයාගත් රටවල් හා පුද්ගලයන්ගේ නම් සඳහන් කළ යුතුය. (ල. 4)

(iii) * නව වෙළඳ මාර්ග හා නව ප්‍රදේශ සොයා ගැනීම. * යුරෝපා රටවල් විසින් විදේශ අධිරාජ්‍ය පිහිටුවා ගැනීම.

* වෙළඳම පුළුල් වීම, වෙළඳ සමාගම් ඇතිවීම. * යුරෝපා රටවල් ආර්ථික වශයෙන් බලවත් වීම. * යුරෝපා රටවල් අතර දේශපාලන බල තරගයක් ඇතිවීම. (ල. 8)

08. (i) * ඩග්ස්බර්ග් සමථයේ දුර්වලකම්. * බොහීමියාවේ පාලනයට ඡන්දයෙන් කෙනෙකු තෝරා පත්කර ගැනීමට ඇති අවශ්‍යතාවය. * ජර්මනියේ කුමාරවරුන්ට සිය ස්වාධීනත්වය ආරක්ෂාකර ගැනීමට අවශ්‍ය වීම.

* ප්‍රංශ බුර්බෝන් හා ජර්මනියේ හැප්ස්බර්ග් වරුන් අතර තිබූ වෛරය.

(ii) වෙස්ට්පේලියා ගිවිසුමේ දීර්ඝකාලීන හා කෙටිකාලීන වගන්ති විස්තර කළ යුතුය.

(iii) * ජර්මනියට වූ විනාශය. * ශුද්ධ රෝම අධිරාජ්‍යයේ බලය අඩුවීම. * ප්‍රංශය යුරෝපයේ නායකත්වයට පත්වීම.

* යුරෝපයේ ආගමික යුද්ධ අවසන් වීම. (ල. 14)

09. අදාළ මාතෘකා සඳහා ලකුණු ලබා දෙන්න. (7 x 2 = 14)